# ගනුදෙනුකරුවන් නිසියාකාරව හඳුනා ගන්න



## මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම සඳහා ඔබේ ව්‍යාපාරය අවභාවිත කරනු ලැබිය හැකි ය.

2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ නිකුත් කර ඇති 2018 අංක 1 දරන නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි පරිදි හඳුනා ගැනීමේ) රීතීන්ට අනුව පහත දැක්වෙන නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර විසින් තම ගනුදෙනුකරුවන් නිසි පරිදි හඳුනා ගැනීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු වේ.

- **කැසිනෝ ව්‍යාපාර**
- **නිශ්චල දේපළ මිලට ගැනීමේ හා විකිණීමේ නිරත ව්‍යාපාර**
- **මැණික් හා ස්වර්ණාභරණ වෙළෙඳුන්**
- **නීතිඥවරුන්, නොතාරිස්වරුන් සහ ගණකාධිකාරීවරුන්**
- **භාරයන් හෝ සමාගම් සේවා සපයන්නන්**

ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි පරිදි හඳුනා ගැනීමේ රීතීන්ට අනුව, සෑම මූල්‍ය නොවන ව්‍යාපාරයක් විසින් ම, අවම වශයෙන්, ගනුදෙනුකරු සහ ප්‍රතිලාභී හිමිකරු පිළිබඳ පහත තොරතුරු ලබා ගත යුතු අතර (ඈ) යටතේ සඳහන් කර ඇති තොරතුරුවල සත්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා අදාළ ලේඛනවල මුල් පිටපත පරීක්ෂා කර එහි ඡායාපිටපතක් ලබා ගත යුතු ය.
ලබාගත් තොරතුරු වසර හයකට (06) වඩා වැඩි කාලසීමාවක් පවත්වාගෙන යා යුතු ය.

| | |
|---|---|
| (අ) සම්පූර්ණ නම | (ඉ) උපන් දිනය |
| (ආ) ස්ථිර, නේවාසික හෝ තැපැල් ලිපිනය | (ඊ) ජාතිය |
| (ඇ) රැකියාව, සේවායෝජකයාගේ නම, ව්‍යාපාරය හෝ ප්‍රධාන කාර්යයන් | (උ) අරමුදල්වල මූලාශ්‍රය |
| (ඈ) නිල පුද්ගලික හැඳුනුම් අංකයක් හෝ ජාතික හැඳුනුම්පත, විදෙස් ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය වැනි ගනුදෙනුකරුගේ හෝ ප්‍රතිලාභී හිමිකරුගේ ඡායාරූපය සහිත වෙනත් ඕනෑම අනන්‍යතා ලේඛනයක් | (ඌ) ගනුදෙනුවේ අරමුණ<br>(එ) දුරකතන අංක (නිවස, කාර්යාලය හෝ ජංගම) |

**එසේම, යම් ගනුදෙනුවක් මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම හෝ වෙනත් ඕනෑම නීති විරෝධී ක්‍රියාකාරකමක් හා සම්බන්ධ බවට සැක කිරීම පිණිස සාධාරණ හේතු පවතින්නේ නම්, ඔබ විසින් එම සැකය www.fiusrilanka.gov.lk වෙබ් අඩවියෙන් ලබා ගත හැකි 2017 සැක කටයුතු ගනුදෙනු (ආකෘති) නියෝගවල V වන උපලේඛනය හරහා ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කළ යුතු වේ.**

**අධ්‍යක්ෂ**
**ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය**
**ශ්‍රී ලංකා මහ බැංකුව**
**අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01**

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

මූල්‍ය බුද්ධි ඒකකය
நிதியியல் உளவறிதல் பிரிவு
FINANCIAL INTELLIGENCE UNIT

0112477125 0112477692 fiudnfbp@cbsl.lk www.fiusrilanka.gov.lk